# 2.47 ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී පූජාවලියේ ඇති වැදගත්කම

ඒ. එස්. පී. එස්. පී. සංජීව[1]
ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

## ABSTRACT

පූජාවලිය රචනා කරන ලද්දේ ii වැනි පරාක්‍රමබාහු රජුගේ අමාත්‍යවරයෙකු වූ දේව ප්‍රතිරාජ ඇමතිගේ ආරාධනයෙන් මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසිනි. මෙය බුදුදහම කෙරෙහි අචල ශ්‍රද්ධාවක් ඇති කිරීමේ අරමුණින් බෞද්ධ භික්ෂූන් වහන්සේ කෙනෙකු විසින් රචනා කළ ද මෙරට ශාසන ඉතිහාසය, රාජාවලිය තත්කාලීන සමාජ චාරිත්‍ර රාජ්‍ය පාලනය, සිරිත්විරිත්, මෙන්ම පොදුවේ ලංකා ඉතිහාසය ද හැදෑරීමේදී ද ඉතා වැදගත් වන කෘතියකි.

උදාහරණ වශයෙන් ගතහොත් මෙරට ඉදි වූ මුල් ම චෛත්‍යය ලෙස සැලකෙන ගිරිහඩු' සෑය පිළිබඳ ප්‍රවෘත්තිය අපට ලබා ගත හැක්කේ පූජාවලියෙනි. එසේම එකල පැවති සූසැට කලාවන් දහඅට ශිල්පය, සූසැට ආභරණ, වෙද හෙදකම්, කාලිංග මාඝ වැනි අයගේ ආක්‍රමණ ආදිය පිළිබඳව මෙන්ම විවිධ සමකාලීන සමාජ, ආර්ථික තොරතුරු ද අපට පූජාවලිය පරිහරණය කිරීමෙන් ලබා ගත හැකි ය.

මෙම තොරතුරු අපට මහාවංස නිකාය සංග්‍රහය වැනි වෙනත් සාහිත්‍ය මූලාශ්‍රය සමඟ සසඳා බැලීමේදී පූජාවලියේ එන තොරතුරු නිවැරදි බව පෙනේ. එමෙන් ම ඇතැම් කරුණුවලට අදාළ ශිලා ලේඛන ද හමු වී ඇති නිසා මෙම ග්‍රන්ථයේ එන තොරතුරු වඩාත් විශ්වසනීය වී ඇති පූජාවලියෙහි භාෂාව ද ඉතා සරලය. රසවත් ය. මෙම අධ්‍යයනයේ අරමුණ පූජාවලියේ ඇති කාලීන සමාජ, ආර්ථික තොරතුරු පිළිබඳ වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමත් සෙසු මූලාශ්‍ර වලින් පූජාවලියේ එන තොරතුරු තහවුරු වන ආකාරය සලකා බැලීමත්ය.

මෙහිදී පූජාවලියේ එන තොරතුරු වෙනත් සාහිත්‍ය කෘති හා ඇතැම් විට ශිලා ලේඛනවල සඳහන් තොරතුරු සමඟ ද සසඳා බැලිය හැකිය.

**Key words**: ශාසන ඉතිහාසය, පූජාවලිය, ශිලා ලේඛණ